00055

59

# ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය

## රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ප්‍රජාතන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යාංශය

## ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය (2015 /1)

## අපරාධ නීතිය හා සාක්ෂ්‍ය නීතිය (01-III)

**කාලය පැය 03 යි.**

**ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.**

---

01 (අ) දණ්ඩ නීති සංග්‍රහයේ දී ඇති අර්ථ නිරූපනයන් සැළකිල්ලට ගෙන පහත සඳහන් දෑ ඉතා සැකෙවින් (වාක්‍යයකින් හෝ දෙකකින්) පැහැදිලි කරන්න.

අ) වංක ලෙස
ආ) සද්භාවය
ඇ) අයුතු අවහිරය
ඈ) ක්‍රියාව සහ නොකිරීම
ඉ) නීත්‍යානුකූල භාරකාරත්වයෙන් අපහරණය කිරීම

(ආ) සාක්ෂි ආඥා පණතෙහි දී ඇති අර්ථ නිරූපනයන් සැළකිල්ලට ගෙන පහත සඳහන් දෑ ඉතා සැකෙවින් (වාක්‍යයකින් හෝ දෙකකින්) පැහැදිලි කරන්න.

ඊ) ප්‍රවාදක සාක්ෂි
උ) කලත්‍රයාගේ සාක්ෂිය
ඌ) උත්තර හඟවන ප්‍රශ්න
එ) කරුණු
ඒ) ඉදිරිපත් කරුණු

(ලකුණු 20)

02 පහත සඳහන් වැරදි සම්බන්ධයෙන් දණ්ඩ නීති සංග්‍රහයේ දක්වා ඇති නිර්වචනයන් නිදසුන් දෙමින් පැහැදිලි කරන්න.

අ) සොරකම (ලකුණු 05)
ආ) කොල්ලකෑම (ලකුණු 05)
ඇ) දේපල පිළිබඳ සාවද්‍ය පරිහරනය (ලකුණු 05)
ඈ) සාපරාධී විශ්වාසය කඩකිරීම (ලකුණු 05)

03 චූදිතයන්ට සාපරාධී ක්‍රියාවක් සම්බන්ධ වගකීමෙන් නිදහස් වීමට දණ්ඩ නීති සංග්‍රහයේ දක්වා ඇති සාමාන්‍ය ව්‍යතිරේකයන් නිදසුන් දෙමින් සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

04 අපරාධයක් සම්බන්ධයෙන් වන පහත සඳහන් එක් එක් අංගයන් නිදසුනක් බැගින් ගෙන හැර දක්වමින් පැහැදිලි කරන්න.

අ). අනුබල දීම (ලකුණු 05)
ආ). පොදු චේතනාව (ලකුණු 05)
ඇ). තැත් කිරීම (ලකුණු 05)
ඈ). නීති විරෝධී සංගමය (ලකුණු 05)

05 අ) සයිමන් දඩයක්කාරයෙකි. ඔහු හිර බැස යන යාමයේ දිය බීමට එන මුවෙකු දඩයම් කිරීමට බැදිවැව අසල ගසකට නැගී තුවක්කුවක් අතැති ව බලා සිටී. කැලය ඇතුලේ සිටි පීටර් දර එකතු කරද්දී ඔහුගේ අත පය වැදී කැලයේ පඳුරු සෙලවුණි. මුවෙකු එන්නේ ය යන සිතුවිල්ලෙන් සයිමන් ඒ දෙසට වෙඩි දෙකක් තැබුවේ නොවරදින ලෙස ඌ මරා ගැනීමට ය. පීටර් වෙඩි වැදී මැරී වැටෙයි. දණ්ඩ නීති සංග්‍රහයේ විධිවිධාන අනුව සයිමන්ගේ අපරාධ වගකීම පැහැදිළි කරන්න.

(ලකුණු 10)

ආ) පහරකින් මරණය සිදු වීමට ඉඩ ඇති දරුණු හෘද රෝගයකින් දයානන්ද පෙළෙන බව ජයන්ත දනිමින් ම ඔහුට ශාරීරික පාඩුවක් කිරීමේ අදහසින් ජයන්ත දයානන්දට පහර දෙයි. එම පහරෙහි ප්‍රතිඵලයක් ලෙස දයානන්ද මිය යයි. යහපත් සෞඛ්‍ය තත්ත්වයක සිටින තැනැත්තෙකුගේ මරණය ස්වභාවික තත්ත්වයක දී සිදු කිරීමට එකී පහර ප්‍රමාණවත් නොවන බව ද සනාථ විය. දණ්ඩ නීති සංග්‍රහයේ විධිවිධාන අනුව ජයන්තගේ අපරාධ වගකීම පැහැදිළි කරන්න.

(ලකුණු 10)

06 අ) ප්‍රාථමික සාක්ෂි යනුවෙන් කුමක් අදහස් කෙරෙන්නේ දැයි නිදසුන් දෙමින් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

අ) ද්විතියික සාක්ෂි යනුවෙන් කුමක් අදහස් කෙරෙන්නේ දැයි නිදසුන් දෙමින් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

07 සාක්ෂි ආඥා පනතේ විධිවිධානයන් ප්‍රකාර ව පහත සඳහන් කරුණු අතුරෙන් හතරක් පිළිබඳ කෙටි සටහන් ලියන්න.

අ. සත්‍ය බව ඔප්පු කිරීමේ භාරය (ලකුණු 05)
ආ. අයහපත් චරිතය පිළිබඳ සාක්ෂි විමසීම (ලකුණු 05)
ඇ. බිඳ ලිය නොහැකි පූර්ව නිගමනය (ලකුණු 05)
ඈ. අපරාධ සහායකයෙකුගේ සාක්ෂිය (ලකුණු 05)
ඉ. මරණාසන්න ප්‍රකාශ (ලකුණු 05)

*******************